# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1715/5 - 2011 ජූලි 18 වැනි සඳුදා - 2011.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ප්‍රාලේ/අක්/අධි/අති 40.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හියාරේ ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 655 අතිරේක 84 සහ 2011.06.10 දිනැති අවසාන ගම් පිඹුරේ කැබලි අංක 3171 සහ 3172 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0630 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (2).

1. කැබලි අංක 3171
ඉඩමේ නම: මහලියද්දගොඩකන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. එච්. සිරිපාල, අංක 400/2, අගලතොල්ලවත්ත, දොරපෙ, අගුලුගහ; ප්‍රමාණය: හෙක් 0.0327.

2. කැබලි අංක 3172
ඉඩමේ නම: මහලියද්දගොඩකන්ද; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. එච්. සිරිපාල, අංක 400/2, අගලතොල්ලවත්ත, දොරපෙ, අගුලුගහ; ප්‍රමාණය: හෙක් 0.0303.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 22 වැනි දින පූ.භා 10.00 ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 සැප්තැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

දමයන්ති පරණගම,
ප්‍රාදේශීය ලේකම්,
අක්මීමන.

2011 ජූලි මස 11 වන දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී.

08-21

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මිල්/ඉ1/1/66.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුංවත්ත බාගේ පත්තුව සුළු කොට්ඨාසයේ, ගොඩකපල්ල ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති පිඹුරු අංක ක 4313 සහ 2011.06.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0119 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබල්ල.

1. කැබලි අංක 1

ඉඩමේ නම: දොඹකොටුව; විස්තරය: ලඳුකැලය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විතානගේ අමරපාල, බුසිගෙමුල්ල, පරගස්තොට; ප්‍රමාණය: හෙක් 0.0119.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 22 වැනි දින පූ.භා 10.00 ට මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 සැප්තැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

විමල් ගුණතුංග,
ප්‍රාදේශීය ලේකම්,
මිල්ලනිය.

2011 ජූලි මස 11 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී,

08-22

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.